# ඇම්. සාර්ලිස් මහතා (1880-1955)



ඇම්. සාර්ලිස් මහතා(මාලිගාවගේ සාර්ලිස්) උපන්නේ 1880 වර්ෂයේ ජුනි 25 දින අම්බලන්ගොඩ දීය. එදා මෙන් ම අදත් කලා විචාරකයන්ගේ ද, කලාකාමීන්ගේ ද නිර්දය විවේචනයට භාජනය වූ කලාකරුවෙකු වෙත්නම් ඒ සාර්ලිස් මහතාය. මේ විවේචනයට වැඩිපුර ම බඳුන් වුයේ, විවේචකයන් සාර්ලිස් මහතාගේ මුඛ්‍ය පරමාර්ථය හඳුනානොගෙන හුදෙක් ඔහුගේ සිතුවම් තුළ ඇති වර්ණ, රේඛා, හැඩතල හා ශෛලිය පමණක් සලකා බැලිම නිසාවෙනි. සිත්තරාගේ සමාජ වගකීම ඕනෑවටත් වඩා ඉහළින් ඉටු කළ ශිල්පීන් වේ නම් ඒ අතරින් ද ප්‍රමුඛයා වන්නේ සාර්ලිස් මහතාය. එතුමාගේ සිතුවම් වල අමු වර්ණ, බටහිර ඌරුව ආදිය මුල්කරගනිමින් එතුමා විවේචනය කළ හා කරනා මුග්ධ සිත්තරුන් හා විචාරකයන් බහුතරය සිය සමාජ වගකීම පිළිබඳව දන්නේවත් නැත. ඔවුන් තුළ ඇත්තේ හුදු මූල්‍යමය පරමාර්ථ පමණී.

සාර්ලිස් මහතා තුළ උපතින් ම චිත්‍ර ශිල්පය පිළිබඳ හැකියාවක් විය. සුප්‍රසිද්ධ නක්ෂත්‍රාචාර්ය එම්. නන්දිරිස් මහතා මෙතුමාගේ පියා ය. නන්දිරිස් මහතා සිය පුත්‍රයා අක්ෂර ශාස්ත්‍ර ඉගෙනීමට වැලිතර ඤාණතිලක හිමිපාණන් වෙත යොමු කරන ලදී. එහි දී සිංහල, පාලි, සංස්කෘත, නක්ෂත්‍රය හා කාව්‍ය ශාස්ත්‍රය ද උගත් මේ මහතා පසුව කොළඹ මාළිගාකන්ද විද්‍යොදය පිරිවෙණෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබීය. මේ කාලයේ දී ටවර්හෝල් රඟහලේ පසුතල සිත්තම්(වස්ත්‍ර චිත්‍ර හෙවත් පෙතිකඩ චිත්‍ර) සකස් කළ රිචර්ඩ් හෙන්රික්ස් ගේ ඇසුර ලැබීමට සාර්ලිස් මහතා භාග්‍යසම්පන්න විය. මේ කාලයේ දී (1909 පමණ කාලයේ දී) හෙන්ඩ්රික්ස් අතින් ග්‍රෑන්ඩ්පාස් හි ජයතිලකාරාමයේ සිත්තම් ද නිම වෙමින් තිබූඅතර එහි ඉතිරි කොටස් නිර්මාණය කිරීමට දායක වීමට සාර්ලිස් මහතාට අවස්ථාව උදා විය.

මෙම සිතුවම් බටහිර ආරට ඇඳි ඒවා වූ අතර මහනුවර සිතුවම් ආරට කිසිදු ඥාතිත්වයක් නොවීය. පර්යාවලෝකනය, අඳුර එළිය

දැක්වීමත් තුළින් ත්‍රිමාණ ලක්ෂණ මතු කිරීම, මානව රූප යථා ලක්ෂණ සහිත වීම ආදී ලක්ෂණ වලින් යුතු මේ සිත්තම් ආර යථා ලෝකයේ දකිනා දෙයට අතිශයින් සමාන වීම නිසා මහජනයා අතර ඉමහත් ජනප්‍රියත්වයක් හිමි කර ගත්තේය. මේ නව සම්භාව්‍ය කලා ආරක් යැයි සිතූ බෞද්ධයෝ ද පැරණි අගනා සිත්තම් මකා ඒ මත මේ නව ආරේ සිත්තම් ඇන්දවීමට පියවර ගත්තෝය. කඩගොල්ලේ මහ සිත්තර ගුරුන්නාන්සේ යටතේ කොළඹ මාළිගාකන්දේ සිතුවම් නිර්මාණය කිරීමට ගිය සාර්ලිස් මහතා කෙරේ පැහැදුණු විහාරාධිපති හිමියෝ විහාරයේ සියලු කලා කටයුතු එතුමාට ම පැවරීය. මේ නිසා මේ විහාරයේ ඇත්තේ සාර්ලිස් මහතා පළමුවරට ස්වාධීනව ඇඳි සිතුවම් ය. එහි දී සූවිසි විවරණය, සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, සුජාතාවගේ කිරිපිඬු දානය ආදී තේමාවන් වලින් සිත්තම් නිර්මාණය විය.

මේ සිත්තම් ශෛලිය සපුරාම වාගේ බටහිර ආරකින් යුතු වීම නිසාත්, බටහිර ශිල්පීන්ගේ හැකියාව හා සසඳත්දී තරමක් පසුපසින් සිටීම නිසාත්, සාර්ලිස් මහතා එදා පටන් ම කලා විචාරකයන්ගේ නිර්දය විවේචනයට පාත්‍ර විය. ඇල්බට් ධර්මසිරි මහතාට අනුව සාර්ලිස් මහතාගේ සිත්තම් ආර වික්ටෝරියානු යථාර්ථවාදී ශෛලියේ දුර්වල අනුකරණයකි. එය සත්‍යයකි. එහෙත් ඒ ඔහුගේ සිත්තම් ආර පමණි. විවේචකයන් ඔහුගේ සමාජ මෙහෙවර අමතක කර විවේචන ඉදිරිපත් කිරීම ද්වේෂ සහගත කාර්යයකි. කිතුණු කලා ආරට සමාජ පිළිගැනීමක් තිබූ යුගයක ඒ ආර අධිරාජ්‍යවාදීන් යටතේ බෞද්ධ අවශ්‍යතා සපුරාගැනීමට යෙදවීම පිළිබඳව සාර්ලිස්මහතාට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය. එංගලන්තයට ගොස් බටහිර ශාස්ත්‍රාලීය කලාව උගත් මේ යුගයේ ලාංකිකයෝ සුදු ස්ත්‍රීන්ගේ ප්‍රතිරූප අඳිමින් ද, භූමි දර්ශන ඇඳ අළෙවි කරමින් ද දිවි සරු කරගත් යුගයක, සාර්ලිස් මහතාගේ සමාජ මෙහෙවර අගයකළ යුතුය. සාර්ලිස් මහතාගේ සිතුවම් ප්‍රධාන වර්ග දෙකකි.

1. විහාර සිතුවම්
2. ලිතෝ මුද්‍රිත සිතුවම්

එතුමාගේ විහාර සිතුවම් ඇති ස්ථාන

- කොළඹ මාළිගාකන්දේ විහාරය.
- කොළඹ අශෝකාරාමය.
- කොළඹ ඉසිපතනාරාමය.
- කොළඹ වේළුවනාරාමය.
- පොතුපිටියේ පූජාරාමය.
- කිරිබත්ගොඩ ඊරියවැටිය, සුදර්ශනාරාමය.
- මතුගම පාන්තිය ශ්‍රී මංගල විහාරය.
- වරකාගොඩ විහාරය.
- බෝමිරිය ගනේවත්ත විහාරය.
- ඉඳුරුවේ යාලේගම විහාරය.



සරණමංගල්‍යයෙන් පසු යශෝධරා කුමරිය කිඹුල්වත්පුරයට කැන්දාගෙන ඒම.

ලිතෝ මුද්‍රිත සිතුවම්

ලංකාවේ බෞද්ධ නිවාස වල පවා වික්ටෝරියා රජ පවුලේ, වික්ටෝරියා රැජිනගේ, කිතුණු ආගමේ සිතුවම් ප්‍රදර්ශනයට තබා තිබූ යුගයක සාර්ලිස් මහතා ඊට එරෙහිව සිය සිත්තම්කරණ හැකියාව ප්‍රයෝජනයට ගත්තේය.

බෞද්ධ ඉතිහාසය, බුද්ධ චරිතය මුල් කර ගත් සිතුවම් පෙළක් දියසායම් මාධ්‍යයෙන් නිර්මාණය කර සුප්‍රසිද්ධ සිංහල ව්‍යාපාරික, ඩී. විලියම් පේද්‍රිස් මහතාගේ උපකාරයෙන් ජර්මනියට යවා ලිතෝ ක්‍රමයට මුද්‍රණය කරවා ගත්තේය. 1923 දී මේ ක්‍රමයට සිතුවම් 36ක් මුද්‍රණය කරවූ සාර්ලිස් මහතා එම සිතුවම් පිළිබඳව ලාංකිකයන් අතර ප්‍රසිද්ධියක් ලබා ගැනීමට බෞද්ධ සිතුවම් වර්ණනා කාව්‍යය නමින් චිත්‍ර නාමාවලියක් කුඩා ග්‍රන්ථයක් ලෙස සකස්කර නිකුත්කරන ලදී. සිතුවම් සඳහා ඉහළ ජනප්‍රසාදයක් හිමිවිය. අධිරාජ්‍ය ගැති සිතුවම් වෙනුවට නිවාසවල බෞද්ධ සිතුවම් ප්‍රදර්ශනය කෙරිණි. මේ සිතුවම් මගින් සාර්ලිස් මහතා සිදුකළ සමාජ මෙහෙවර අගය කිරිමට මීට පෙර ඒ මහතා නිර්දය ආකාරයෙන් විවේචනය කළෝ ඉදිරිපත් නොවීම කණගාටුදායකය.

සාර්ලිස් මහතාගේ ලිතෝ මුද්‍රිත සිතුවම්.

- තුසිත දෙව්පුත් මිනිස් ලොව ඉපදීමට ආරාධනා කිරීම.

තොරතුරු-අමිල කෝසල උඩවත්ත-සමන් කුමාර විජේරත්න.

- මහාමායාදේවිය දුටු සිහිනය.
- මහාමායා දේවිය දෙව්දහනුවර බලා පිටත් වීම.
- බෝසත් උපත.
- බෝසත් කුමරා සත්පියුම් මත වැඩහිඳ කළ අභීත ප්‍රකාශය.
- මව සහ බෝසත් කුමරා ආපසු කිඹුල්වත්පුරයට වැඩම කිරීම.
- අසිත ඍෂිවරයා රජමැදුරට පැමිණීම.
- ප්‍රජාපතී ගෝතමී හා සිදුහත් කුමරා.
- වප්මගුල් උළෙල.
- ඥාතීන් මැද ශිල්ප දැක්වීම.
- සරණ මංගල්‍යය.
- සරණමංගල්‍යයෙන් පසු යශෝධරා කුමරිය කිඹුල්වත්පුරයට කැන්දාගෙන ඒම.
- බෝසතුන් උයන්කෙළියට යාම.
- නිළියන්ගේ විප්‍රකාර දර්ශනයෙන් කළකිරීමට පත් වීම.
- ගිහිගෙය හැර යාම.
- අනෝමා ගඟින් එතෙර වීම.
- හිසකෙස් සිඳ දැමීම.
- සුජාතාවගේ කිරිපිඩු දානය.
- මරඟනන් පැරදවීම.
- ප්‍රථම ධර්ම දේශනය.
- සීවලී මහරහතන්වහන්සේ.

මේ සිතුවම් වල දක්නට ඇත්තේ ද යුරෝපීය ක්‍රිස්තියානි ආභාසයයි. උදාහරණ වශයෙන් "ප්‍රජාපතී ගෝතමිය හා සිද්ධාර්ථ කුමරු" නම් සිතුවම දැක්විය හැක. එහි ස්වභාවය "මරියතුමිය හා ජේසු බිළින්දා" සිතුවමට සමානය. එහෙත් මානවරූපකරණයට, මානව ඉරියව් නිර්මාණයට, හැඟීම් ප්‍රකාශනයට ඔහු සතුව තිබූ හැකියාව නොසලකාහැරිය නොහැක. මුල් කාලීන සිතුවම් වල අමුවර්ණ යෙදීමේ ක්‍රමය වෙනුවට පසුකාලීනව ඔහු ප්‍රශස්ත වර්ණගැන්වීමේ රටාවක් නිර්මාණය කරගෙන තිබූ බව ද පෙනී යයි. එය ද අගයකටයුතුය.

මෙතුමාගේ සිතුවම් වල පසුතල වල ද යුරෝපීය ආභාසය දැකිය හැක. ගොඩනැගිලි උද්‍යාන ආදියේ මේ ස්වභාවය දැකිය හැක. උයන්කෙළියට යාම නිරූපිත සිත්තමේ යුරෝපීය උද්‍යානයක සිරි රැගත් පසුතලයක් දැකිය හැක. මීට අමතරව අභිනිෂ්ක්‍රමණය, නිළියන්ගේ විප්‍රකාර දැකීම ආදී සිතුවම් වල ද යුරෝපීය ගෘහනිර්මාණ ලක්ෂණ (ආරුක්කු, බිතුකැටයම්, කුළුණු) දැකිය හැක. ඇතැම් වෘක්ෂලතා

ආදිය ද පෙරදිග හෝ දේශීය ලක්ෂණයන්ගෙන් තොර ය. හිම පතනය සහිත ප්‍රදේශ වල වැඩෙනා වෘක්ෂලතා ආදිය ද පෙරදිග හෝ දේශීය ලක්ෂණයන්ගෙන් තොර ය. මේ සිතුවම් වල ඇඳුම් හා පැළඳුම් ද තරමක බටහිර ආරක් ගෙන ඇත. සිද්ධාර්ථ යශෝධරා සරණ මංගල්‍යය දක්වෙන සිත්තමේ යුරෝපා ආභාසය උපරිමයෙන් ම දකගත හැක.

වර්ණ භාවිතය පිළිබඳ විමසීමේ දී මුල් කාලීන සිතුවම් වලට වඩා පසු කාලීන සිතුවම් තුළින් ඔහු පරිණත බවක් පෙන්වා ඇත. අමු වර්ණ භාවිතය අඩු වී අවස්ථාවෝචිත හා මිශ්‍ර වර්ණ භාවිතයට යොමු වී ඇත. නිළියන්ගේ විප්‍රකාර දකීම නමැති සිත්තමේ අළු, නිල්, කළු පැහැයන් එහි රාත්‍රී ස්වභාවය නිරූපණය කර ඇත. උත්කර්ෂවත් අවස්ථා දක්වෙන චිත්‍ර සඳහා දීප්තිමත් වර්ණ භාවිත කර ඇති බව සිද්ධාර්ථ කුමරුන්ගේ විවාහමංගල්‍යයෙන් පසු යශෝධරාව කැඳවාගෙන යන ආකාරය දක්වෙන සිත්තමෙන් පෙනෙයි.

සත්ත්ව රූප සිත්තම් කිරීමේ දී සාර්ලිස් මහතා යම් දක්ෂතාවක් දක්වා ඇතත්, ගවයා වැනි පෙරදිග ප්‍රමුඛ සත්ත්ව රූප නිර්මාණයේ දී දක්වා ඇති හැකියාව පිළිබඳ සතුටු විය නොහැක. එහෙත් අශ්වයා සිත්තම් කිරීම පිළිබඳ ඔහු තුළ ප්‍රශස්ත හැකියාවක් තිබූ බව උයන්කෙළියට යෑම, අභිනිෂ්ක්‍රමණය, අනෝමා ගඟින් එතෙර වීම වැනි සිතුවම් වලින් පෙනේ. මේ සිතුවම් සඳහා අශ්ව රූප යම් ආධාරක රූ සටහනක් යොදාගෙන නිර්මාණය කළා ද යන්න පැහැදිලි නැත. පර්යාවලෝකන නිරූපණය ඇතැමක උසස් අයුරින් දක්නට ලැබුණ ද, ඇතමක දුර්වල තත්ත්වයක පවතී. මහාමායා දේවිය දුටු සිහිනය පිළිබඳ සිත්තමේ පර්යාවලෝකන ලක්ෂණ උසස් අයුරින් දක්නට ලැබුණ ද වප්මඟුල් අවස්ථාව දැක්වෙන සිත්තමේ පර්යාවලෝකන ලක්ෂණ නිරූපණය දුර්වල තත්ත්වයක පවතී.

මේ කෙසේ වෙතත් සිය සිත්තම්කරණ හැකියාවෙන් උසස් සමාජ මෙහෙවරක් කළ සිත්තරුන් අතරට සාර්ලිස් මහතා ද එක් වේ.

සාර්ලිස් මහතාගේ සිතුවම් වල බටහිර ආභාසය දකින්න. සසඳා බලන්න. පහතින් ඇත්තේ ලෙයනාදෝ දාවින්සිගේ සිත්තම් කිහිපයකි.



ප්‍රජාපතී ගෝතමී හා සිදුහත් කුමරා.

සාර්ලිස් මහතාගේ සිතුවමකි.





